# දශ වස්තුව පිළිබඳ පැරණි ථේරවාදී මතය සහ එහි නූතන භාවිතය

ඩබ්ලිව්. ඩී. එස්. ෆොන්සේකා - බෞද්ධ අධ්‍යයනාංශය

මෙම පර්යේෂණයෙන් වජ්ජිපුත්තක භික්ෂූන් ඉදිරිපත් කළ දශ වස්තුව අකැප යැයි බැහැර කිරීම හා එහි ඇතුළත් ඇතැම් පිළිවෙත් නූතන භික්ෂු සමාජයේදී අනුගමනය කරන්නේදැයි යන්න පිළිබඳව විමසනු ලැබිණි. දෙවන ධර්ම සංගායනාවට මූලික පසුබිමක් ඇති කළ දශ වස්තුව මුල් කාලීන ථෙරවාදී භික්ෂූන් විසින් ප්‍රතික්ෂේප කළද එම දශ වස්තුවේ ඇතුළත් ඇතැම් කොටස් වර්තමාන ථෙරවාදී භික්ෂූන් වහන්සේලා අනුගමනය කිරීමට පෙළඹී සිටින්නේ මක් නිසාද යන්න මෙහි කේන්ද්‍රීය ගැටලුව ලෙස යොදා ගන්නා ලදී. මුල් කාලීන ථෙරවාදී භික්ෂූන් විසින් ප්‍රතික්ෂේපිත දශ වස්තුව වත්මන් සංඝ සමාජය අනුගමනය කිරීමට බල පෑ හේතු විමසීම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ විය. බුදුන් වහන්සේ ජීවමානව සිටි අවදියේදී භික්ෂු සමාජය තුළ දශ වස්තුව කැප වශයෙන් ගෙන කටයුතු කිරීම් පැවතියේද යන්න විමසීම මෙහි තවත් අරමුණක් විය. පර්යේෂණය සිදු කිරීමේදී ගුණාත්මක ක්‍රමවේදය භාවිත කළ අතර එහිදී සම්මුඛ සාකච්ඡා ප්‍රධාන වශයෙන් යොදා ගැනුණි. ප්‍රාථමික හා ද්විතීය මූලාශ්‍රය මඟින් සොයාගත් තොරතුරුද උපයෝගී කරගන්නා ලදී. සම්මුඛ සාකච්ඡා සඳහා ඉංගිරිය හා දෙණියාය යන ප්‍රදේශවලින් ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලා සය නමක් සහ කළුතර ප්‍රදේශයෙන් ග්‍රාමවාසී භික්ෂූන් වහන්සේලා සය නමක් තෝරා ගන්නා ලදහ. මෙම පර්යේෂණයේ දී මුල් කාලීන භික්ෂූන් බුදුසසුනේ චිරස්ථිතිය උදෙසා දශ වස්තුව ප්‍රතික්ෂේප කළද සමාජයීය පරිවර්තන සමඟ බුදුසසුන වෙනස් වීම හේතුවෙන් නූතන භික්ෂූන් දශ වස්තුව අනුගමනය කිරීමට නිරායාසයෙන් පෙළඹී තිබේ යන උපන්‍යාසය භාවිතා කෙරිණි. පර්යේෂණය අවසානයේදී මෙම උපන්‍යාසය තහවුරු විය. ඇතැම් භික්ෂූන් වහන්සේලා දශ වස්තුවේ ඇතුළත් ඇතැම් පිළිවෙත් අනුගමනය කිරීම වර්තමාන සමාජයට අනුකූලව සිදුවන බවත් එසේ කිරීම භික්ෂු සමාජයේ ඉදිරි පැවැත්මටද පිටිවහලක් වන බවත් පැවසූහ. ඇතැමෙකුගේ මතය වූයේ දශ වස්තුව අනුගමනය කිරීම භික්ෂුවකට නුසුදුසු බවයි. එයින් ශාසනය දියුණුවට නොව පරිහානියට පත් වන බවයි. සමාජ වෙනස් වීම ඔස්සේ වර්තමාන භික්ෂූන් වහන්සේලා දශ වස්තුව අනුගමනය කිරීමට යොමුව සිටින බවත් එසේ කිරීමෙන් හෝ නොකිරීමෙන්ද භික්ෂු ශාසනයට බලපෑමක් සිදුවන බවත් ඒ අනුව පැහැදිලි වේ.

**ප්‍රමුඛ පදඃ** *දශ වස්තුව, ථේරවාදය, ශාසනික චිරස්ථිතිය*